ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

# මාධ්‍ය නිවේදනයයි

## රට පුරා විවිධ දිස්ත්‍රික්කයන්හි ඇතිවී ඇති ආපදා තත්ත්වයන් සම්බන්ධයෙන් සහන සැලසීම

අයහපත් කාලගුණය හේතුවෙන් මේ වන විට රට පුරා විවිධ දිස්ත්‍රික්කයන් වෙත බලපා ඇති ගංවතුර, නායයෑම් හා අනෙකුත් ආපදා තත්ත්වයන්හි දී මහජනයාගේ ආරක්ෂාව සහ සුභසාධනය තහවුරු කරලීම සම්බන්ධයෙන් ගත යුතු සියළු ක්‍රියාමාර්ගයන් නොපමාව ගැනීමට කටයුතු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමා විසින් රාජ්‍ය නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.

පවතින අධික වර්ෂා තත්ත්වය හේතුවෙන් ඇති විය හැකි නායයෑම්, පස් කඳු කඩා වැටීම්, ගල් පෙරලීම් වැනි අවදානම් තත්ත්වයන්ට මුහුණ දීම පිණිස ආරක්ෂක අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණයෙන් ආපදා අවම කිරීමට සහ කඩිනම් ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය වාතාවරණය ඇති කිරීමට හා මහජන සුභසාධනය සඳහා ක්ෂණික පියවර ගැනීමට අදාළ අමාත්‍යාංශයන්හි නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත චක්‍රලේඛ උපදෙස් මඟින් මේ වන විට දැනුම් දී ඇත.

මෙම සියළු කාර්යයන් සම්බන්ධීකරණය හා සමාලෝචනය ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකිරීමට ද කටයුතු සලසා තිබේ.

ජනාධිපති කාර්යාලය
**2019-12-02**

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01

දුරකථන / தொலைபேசி / Telephones: 011 2354354, 011 4354354

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2340340

ඉ-තැපෑල / மின்-அஞ்சல் / e-mail: ps@presidentsoffice.lk